**පොළොන්නරුව මහා නගර සභාව - 2022**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොළොන්නරුව මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු පොළී වියදම රු.85,583 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් කාලපරිච්ඡේදයට අදාළ සියලුම වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයට අදාළව ලැබී තිබුණු රු.3,236,533 ක් වූ උසාවි දඩ හා රු.205,000 ක් වූ මුද්දර ගාස්තු මුදල් ලැබීම සමාලෝචිත වර්ෂයේ විවිධ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබූ රු.7,781,329 ක කර්මාන්ත නිමකර තිබුණද සමාලෝචිත වර්ෂයේද කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිමකර තිබූ රු. 8,129,739 ක මංමාවත්, පාලම් හා බෝක්කු සහ රු. 22,063,386 ක ගොඩනැගිලි වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය රු.21,675 ක් වූ ටැබ් යන්ත්‍රයක් මූල්‍ය ප්‍රකාශනවල රු.216,750 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දී LDSP ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත ලැබී තිබූ රු.5,282,051 ක් වටිනා සෙල්ලම් උපකරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (උ) | සභාව සතු ජංගම වෙළඳ කුටි 06 ක වටිනාකම රු. 1,560,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වෙළඳ කුටි 02 ක වටිනාකම රු.870,874 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | විද්‍යුත් පුස්තකාල 03 ක්, සඳහා සමාලෝචිත වර්ෂයේදී ලද රු.1,438,096 ක් වටිනා උපකරණවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (එ) | රජයෙන් සහ පළාත් සභා ආයතනවලින් ලැබූ මුළු ප්‍රාග්ධන ප්‍රදාන රු.45,089,831 ක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඒ) | තොග ලේඛන අනුව මර්කරි බල්බ් තොගයක වටිනාකම රු.51,430 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.514,300 ක් ලෙස රු.462,870 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඔ) | 2021 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේ දී රජයෙන් හා පළාත් සභා ආයතන වලින් ලද රු.19,672,519 ක ප්‍රාග්ධන ප්‍රදාන ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඕ) | ගබඩා ලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 1,270,689 ක් වූ අයිතම 24 ක් මූල්‍ය ප්‍රකාශනෙවල තොග වලට ඇතුළත් කර නොතිබුණි. | -එම- | සියළුම ඉතිරි තොග වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ක) | ගබඩා අයිතම 22 ක වටිනාකම නිවැරදිව හඳුනා නොගැනීම නිසා රු. 188,301 කින් සමාලෝචිත වර්ෂය අවසානයට තොගය මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 03 ක එකතුව සහ ඒවාට අදාළ උපලේඛනවල ශේෂ අතර රු.274,040 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සැසඳීම් කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.88,522,252 ක් වටිනා ගිණුම් ශේෂ 05 ක ශේෂ සනාථ කිරීම්, යාවත්කාලීන කරන ලද ලේඛන, ආදායම් ලේඛන, පැමිණීමේ ලේඛන, බැහැර යාමේ ලේඛන සහ කළ වැඩ වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ඉදිරිපත් කළ බව | ඉදිරිපත් කළ බව දක්වා ඇතත්, ඉදිරිපත් කර නොමැති බැවින් නොසැපයූ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු 29 දිනැති අංක 2086/15 දරන අති විශේෂ ගැසට් පත්‍රය | මහා නගර සභාවේ නගරාධිපතිවරයා විසින් භාවිතා කරන කැබ් රථය සඳහා මාසිකව අනුමත ඉන්ධන ලීටර් 400 සීමාව ඉක්මවා අවස්ථා 07 කදී ඉන්ධන ලීටර් 912 ක් ලබාගෙන තිබුණි. | ඉන්ධන ලබා ගැනීම සඳහා අනුමැතිය පිණිස පළාත් පාලන දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව. | සීමාවන් ඉක්මවා නොයන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනතේ විධිවිධාන දක්වමින් පළකර තිබූ 2235/54 හා 2021 ජූලි 08 දිනැති ගැසට් පත්‍රය vi කොටසේ 83(1) වගන්තිය | 2018 හා 2019 වර්ෂ දෙකෙහි ගොඩනැගිලි සැලසුම් අනුමත කර සංවර්ධන බලපත්‍ර ලබාගෙන තිබුණු පුද්ගලයින් 119 දෙනෙකු විසින් අනුකූලතා සහතික ලබාගෙන නොතිබුණි. | අනුකූලතා සහතික ලබා ගන්නා ලෙස දැනුම් දී ඉදිරි කටයුතු කිරීමට සටහන් කරගෙන ඇති බව. | අනුකූලතා සහතික ලබා නොගන්නා පුද්ගලයින් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා නගර සභාවේ අයහාරය ඉක්මවූ වියදම රු.29,640,178 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයහාරය ඉක්ම වූ වියදම රු.12,003,474 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 28,984,000 | 28,984,000 | 26,338,179 | 27,087,606 | 24,793,647 | 43,559,956 | 22,523,966 | 24,441,785 |
| (ii) | කුලී | 84,343,000 | 84,343,000 | 59,173,832 | 61,295,343 | 98,554,680 | 54,166,572 | 33,224,891 | 36,666,175 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,100,000 | 3,946,004 | 3,946,004 | 0 | 3,397,800 | 4,248,576 | 4,041,576 | - |
| (iv) | වෙනත් ආදායම් | 63,446,000 | 21,337,824 | 18,093,574 | 3,244,250 | 49,944,999 | 18,362,419 | 33,196,288 | - |
| | එකතුව | 182,873,000 | 138,610,828 | 107,551,589 | 91,627,199 | 176,691,126 | 120,337,523 | 92,986,721 | 61,107,960 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ආදායම රු.20,623,656 ක් විය. | නිරවුල් කරගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් නිරවුල් කරගත යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතු කඩකුලී ආදායම රු.52,697,010ක් වූ අතර, ලැබිය යුතු එක්වන් මුදල රු.16,084,890 ක් විය. | හිඟ අයකිරීමට කටයුතු කර ඇති බව. | හිඟ ආදායම් කාලීනව අයකළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු දේපල බදු දීමේ ආදායම රු.8,598,332 ක් විය. | -එම- | දේපල බදුදීමෙන් ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 03 කට වඩා වැඩි කාලයක සිට පැවත එන ලැබිය යුතු වත්කම් බදු දීමේ ආදායම රු.3,033,274 ක් විය. | හිඟ මුදල් අයකිරීමට නීතිමය පියවර ගැනීම සඳහා නීති නිළධාරි වෙත ඉදිරිපත් කර ඇති බව. | නියමිත පරිදි ලැබිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | මහා නගර සභාව සතු පැරණි සතිපොළ කඩ කාමර 27 ක් 2021 වර්ෂයේ සිට ජලය හා විදුලිය පහසුකම් ලබානොදීම මත කුලී අය නොකිරීම හේතුවෙන් | කඩකුලී අයකිරීම විදුලි,ජල පහසුකම් නොතිබීමේ හේතුන් මත අත්හිටුවා ඇති බව. | ව්‍යාපාරික ස්ථාන සඳහා අවශ්‍ය මූලික පහසුකම් සැපයීම සඳහා කටයුතු කළ යුතුය. |

වාර්ෂිකව උපයාගත හැකි රු.1,260,000 ක පමණ ආදායම් අහිමි වී තිබුණි.

**(ඇ) වෙනත් ආදායම්**

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කසල ගාස්තු ආදායම රු. 6,463,950 ක් විය. | හිඟ කසල ගාස්තු අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ඉදිරිපත් කළ ලේඛන අනුව පළාත් සභාවේ ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම රු.160,000 ක් සහ මුද්දර ගාස්තු ආදායම රු.4,926,000 ක් විය. | අදාළ බලධාරීන් වෙත ලිඛිතව දන්වා ඇති බව. | සභාවට ලැබිය යුතු අදාළ ආදායම් කාලීනව ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන මහා නගර සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **අත්හැර දැමූ කර්තව්‍යයන්** | | |
| | 2021 වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ආරම්භ කරන ලද රු.42,091,260 ක ගිවිසුම් වටිනාකමක් සහිත ව්‍යාපෘති 08 ක් මුදල් නොලැබීම හේතුවෙන් අතරමඟ නවතා දමා තිබුණි. එම ව්‍යාපෘති සඳහා විගණිත දින වන විට රු.6,793,428 ක මුදලක් ගෙවීම් කර තිබුණද, එම වැඩ අතරමඟ නවතා දමා තිබීම හේතුවෙන් එම මුදල් නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ව්‍යාපෘති සඳහා වැයකරන ලද මුදල් නිෂ්කාර්ය නොවීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| | මහා නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු කරනු ලබන මුළු කසල ප්‍රමාණය ටොන් 20 ක් වන අතර, 2022 මුල් මාස 06 තුළ නිෂ්පාදනය කර තිබුණු කාබනික පොහොර ප්‍රමාණය ටොන් 21 ක් වැනි අවම ප්‍රමාණයක් විය. | කසල අංගනය ප්‍රමාණවත් නොවන බැවින් ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ රැස්කරන ලද දිරන කසල වෙනම ගොඩගසා ඇති බව දන්වා ඇත.ඉල්ලුම අනුව අවශ්‍යතාවය මත පමණක් පොහොර නිශ්පාදනය කර පැකට් කරනු ලබන බව. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය. |